රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 02/96

මගේ අංකය :- III/163/8/28/එල්/එල්11
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1996 ජනවාරි මස 13 වෙනි දින

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාමසාන් සමයේදී විශේෂ නිවාඩු ලබා දීම.

1995 ජනවාරි මස 27 වැනි දින අංක : 5/95 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1996 වර්ෂයේ රාම්ලාන් (රාමසාන්) උත්සව සමයේදී මුස්ලිම් භක්තික රාජ්‍ය නිලධාරීන්ට /සේවකයින්ට යාඥ සහ ආගමික වතාවත්වල නිරතවිය හැකිවන පරිදි වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. ආගමික සහ යාඥ කටයුතු දිනපතා සිදු කෙරෙන කාල වේලාවන් පහත දක්වෙන පරිදි වේ.

* පෙරවරු 3.30 සිට පෙරවරු 5.30 දක්වා
* පෙරවරු 6.00 සිට පෙරවරු 7.00 දක්වා
* පස්වරු 6.00 සිට පස්වරු 7.00 දක්වා
* පස්වරු 8.00 සිට රාත්‍රී 10.00 දක්වා

04. මෙම කාලසීමාවන් තුලදී ආගමික වතාවන්වල යෙදීමට හැකිවන පරිදි සැමවිටම වැඩමුර සකස් කර දිය යුතුය. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

05. තවද 1996 රාම්ලාන් (රාමසාන්) අවසන්වීමේ දිනට දින 14 කට කලින් රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට / සේවකයින්ට උත්සව අත්තිකාරම් ලබා දීමට ද කටයුතු කිරීම මැනවි.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය